10

නවම් මහේ නව වළල්ල

ඕනෑ ම ජීව භාෂාවක ව්‍යවහාරයේ විවිධත්වයක් දැකිය හැකි ය. ලේඛනය හා භාෂණය ඉන් ප්‍රධාන වේ. ලිවීම සඳහා ලේඛන ව්‍යවහාරයත් කථා කිරීම සඳහා භාෂණ ව්‍යවහාරයත් යොදා ගැනෙයි.

එක් භාෂාවක් කතා කරන සියල්ලන්ගේ ම ව්‍යවහාරය එක සමාන නැත. ජීවත් වන පරිසරයේ භූගෝලීය සාධක අනුව ද ජීවනෝපාය මාර්ග අනුව ද භාෂා ව්‍යවහාරයේ වෙනස්කම් දැකිය හැකි ය. එසේ වෘත්තිය හා බැඳුණු භාෂා ව්‍යවහාර අදාළ අවස්ථාවට සීමා වෙයි. එබැවින් ඒවා පරිමිත ව්‍යවහාර ලෙස හැඳින්වේ. ධීවර භාෂාව, කමත් භාෂාව, පතල් භාෂාව ආදිය එබඳු පරිමිත ව්‍යවහාර වේ. මේ පාඩමේ දැක්වෙන්නේ ධීවර භාෂාවේ හමු වන යෙදුම් කිහිපයකි. ඔරුක්මාන්කුළමේ චන්දන හිමියන්ගේ 'වෙරළ' කෘතිය ඇසුරෙන් මේ පාඩම රචනා වී ඇත.

වාරුව	අම්බාව
ඕඩි හෙලයි හෙලයියා	
ඕඩි හෙලයි හෙලයියා	
	ඔරුව දියත් කර ගන්නේ
	දැල් මන්දත් අර ගන්නේ
ඕඩි හෙලයි හෙලයියා	
ඕඩි හෙලයි හෙලයියා	
	ඔහෙ ඇදපං යාළු
	ගොඩ ඇදපං යාළු
ඕඩි හෙලයි හෙලයියා	
ඕඩි හෙලයි හෙලයියා	
	මඩිය තදයි යාළු
	බරටම ඇති මාළු
ඕඩි හෙලයි හෙලයියා	
ඕඩි හෙලයි හෙලයියා	
	දැල මැද නැත පාළු
	ගොඩ ඇදපන් යාළු

ඕඩි හෙලයි හෙලයියා... කියමින් ධීවරයෝ වෙරළේ සිට දැල් අදිති. ඔවුන්, දැල් අදින විට ගායනා කරන කවි 'අම්බාවන්' වේ. ධීවරයාට දැල 'ජාලය' වෙයි. දැල් අදින්නෝ, ජාලියෝ හෙවත් අම්බාවෝ වෙති.

ධීවරයාට මුහුදු ගොස් ජාලය එළීමට උපකාර වන්නේ ඔරුව යි. ධීවරයා මුහුදු යෑමට උපකාර කර ගන්නා මුහුදු යාත්‍රාව 'ඔරුව' ලෙස හඳුන්වයි. ඔරුවේ ඉදිරිපස කොටස 'ඇණිය' යි. පසුපස කොටස 'අවර' යි. ඔරුවේ පසුපස හබල් දෙක 'අවල' වේ. ඔරුවේ මැද දෙපසේ හබල් 'කස් අවල' යැයි ධීවරයෝ කියති. පාරම්පරික ධීවර යාත්‍රා අතර ජවාධික යාත්‍රාව රුවල් ඔරුව යි. ඈත දියඹේ මසුන් පන්න කිරීමට රුවල් ඔරුව උපයෝගී කොට ගනු ලබයි.

සුළඟ නමැති අකීකරු බලවේගය මෙල්ල කොට ගැනීමේ අගනා තාක්ෂණයක් මසුන් මරන්නා සතු වන බව හෙළි වන්නේ රුවල් ඔරුවලිනි. රුවල් ඔරු සුළං බලයෙන් ගමන් කරයි. දියඹේ දී සුළං මගින් යෑමට උපකාර වන්නේ රුවල යි. රුවල් එසවීම "රුවල උඩු දීම" වේ. තෙරක් නො පෙනෙන ගැඹුරු මුහුදෙහි ඔරුව නතර කරන්නේ නැංගුරම් ලෑමෙනි. නැංගුරම් ලෑමට අතීතයේ භාවිත කොට ඇත්තේ විශාල ගලකි. ගල, ලණුවලින් ගැට ගසා ගැඹුරු දියට දමනු ලබයි. ධීවරයා එයට "ගල් බානවා" හෝ "ගල් කඩනවා" යයි කියයි.

දින ගණනක් ඈත දියඹේ ගත කරන ධීවර වෘත්තිකයාට බලපෑමක් ඇති කරන්නේ කාලගුණය යි. වර්ෂාව, සුළඟ ඔහුගේ ජීවිතයට අනතුරක් ගෙන දෙන්නට හේතු වේ.

එබැවින් ධීවර ගැමියා මුහුදු යෑමේ දී 'ඉයත්තුව' කෙරෙහි සැලකිලිමත් වෙයි. ඉයත්තුව යනු කාලගුණය යි. මුහුදු රළ 'මාරියාව' යි. සාගරයේ චණ්ඩ ස්වරූපයෙන් 'වාරකන්' කාලය එළඹෙයි. වාරකන් කාලයට මාරියාව රළු වෙයි. මුහුදු යන්නෝ වාරකන් කාලයට මුහුදු ගමන් අත්හරිති. එබැවින් ධීවර සාමාජිකයාට එම කාලය ආර්ථික වශයෙන් අවාසි කාලයකි. ධීවරයාගේ සුබ කාලය 'හරාව' යි. මුහුදේ මාරියාව චණ්ඩ නොවන කාලය 'හරාව' කාලය යි. 'හරාව' කාලයට ම 'වළාල' කාලය යැයි ධීවරයා වහරයි.

මුහුද නමැති කෙතෙහි අස්වැන්න නෙළන ධීවරයා වැස්ස වහිනවා නො කියයි. "ගඟුලාව කරුණා කරනවා" යනුවෙන් වහරයි. එමෙන් ම වර්ෂාවට 'කෝඩය' යැයි කියනු ලබයි. වර්ෂාව සමග අහස ගෙරවීම 'හයිය' වේ. ගොඩබිම කරා ඇදී යන මුහුදු රළවල සැඩබව 'ඊරුවා සැර වීම' යි.

සත් සමුදුර පිළිබඳ ජීවන අද්දැකීම් බහුලව ඇත්තේ මුහුදු යන්නාට ය. දියඹ සරන්නා සාගරයේ මුහුදු හතක් දකියි. වෙරළේ සිට සැතපුම් බාගයක් පමණ විහිදී යන මුහුද 'කහ මුහුද' යි. 'කොළ මුහුද' ලෙස ධීවරයා දකින්නේ කහ මුහුදේ සිට සැතපුමක් පමණ දුරට විහිදී යන නොගැඹුරු මුහුද යි. කොළ මුහුදට එපිටින් ඇති මුහුද 'නිල් මුහුද' යි. සුළං ප්‍රභවය වන හෙයින් මෙය 'නලමාලි' මුහුද යනුවෙන් ද හැඳින්වේ. 'රතු මුහුද' 'රත් බොල් දියාත' ලෙස වෙරළාසන්න කට වහරේ කියැවෙයි. මුහුදු ජලතලය මතුපිට මුහුදු පැළෑටි වැවෙන්නේ මේ මුහුදු සීමාව තුළ බැවින් රාත්‍රියේ දී රතු පාටින් දිලිසෙයි. පැහැයෙන් කාල වර්ණ වූ බලයන් බහුලව ගැවසෙන දියඹ කළු පාට හෙයින් ඒ මුහුද 'කළු මුහුද' වේ. එහි ප්ලවාංග බහුල ය. කිරි මුහුදේ හෙවත් සුදු මුහුදේ පන්න කිරීමට යන්නේ දක්ෂ ධීවරයන් ය. තෝරු, මෝරු ආදි ධවල පැහැ වටිනා මත්ස්‍යයන් වසන්නේ කිරි මුහුදෙහි හෙවත් සුදු මුහුදෙහි ය. සඳ එළිය වැටුණ විට කිරි පාටින් බබළන්නේ 'කිරි මුහුද යි'. ඈත පිටිසර ගැමියන් 'හෝගාන පොකුණ' ලෙස හඳුන්වන්නේ රළ බිඳී, හැපෙන අද්දර මුහුදු ප්‍රදේශය යි. අධික නිසලතාවකින් යුතු ගැඹුරු මුහුද 'ගොළු මුහුද' වේ. හිම මිදෙන්නේ ගොළු මුහුදෙහි ය.

සාගරය කලඹන්නේ අන් කිසිවකු නො ව ධීවරයා ය. මුහුදේ සුළං වේගය අඩු වන කාලය නවම් මාසය බව ධීවරයා දනියි. නවම් මාසේ දී මුහුදු රළ නවයක් මුහුදින් මතු වෙයි. ධීවරයා "නවම් මහේ නව වළල්ල" දැක සතුටට පත් වෙයි.

අවබෝධය

1. **ධීවර ප්‍රජාව 'දැල් අදින අවස්ථාවේ' භාවිත කරන කවි වර්ගය කුමක් ද?**
2. **දැල් අදින්නන් හැඳින්වීමට යෙදෙන වෙනත් නම් මොනවා ද?**
3. **'සත් සමුදුර'ට අයත් මුහුදු හත නම් කරන්න.**
4. **'වාරකන් කාලය' ධීවරයාට අවාසි කාලයක් වන්නේ ඇයි?**

ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් ධීවර ජන කවියේ ඇතුළත් ධීවර බසෙහි යෙදෙන වචන තෝරා ලියන්න.**

වාරයා වාරකන්මයි බහින්නේ
හරහයා හතුරුකන් මයි කරන්නේ
මාරියා ගෙඩිය පස්සෙන් හඹන්නේ
ලිහිණියා කඩුල්ලෙන් තංගලු යන්නේ

2. **පහත සඳහන් පාඨවල අන්තර්ගත ධීවර ව්‍යවහාරයේ යෙදෙන වචන තෝරා එම වචනවල පොදු ව්‍යවහාරය ලියන්න.**

i. දණ්ඩ ගසා ගත් මහල්ලා ඔරුවේ අවරයට යට සිටි මාළුවා, රුවල් දණ්ඩෙන් ඇන ළඟට ගත්තේ ඔරු පල්ලේ අකුළා දමා තිබුණු යොත් සමග පටලවා නොගැනීමට පරිස්සම් වෙමිනි.

ii. හිටි හැටියේ ම ඉයත්තුව නරක අතට හැරෙන මාසවල වළේ මුහුදට යාමට බිය වීමෙහි ඇත්තක් තියෙන බව මහල්ලා පිළිගත්තේ ය.

iii. ඔරුවේ ඇණියට ගිය මහල්ලා තිමිංගලයා සමග පියාමැස්සන් දෙදෙනා ලැල්ල උඩ තබා කරට ගෙන සිටි යොත කරේ වෙනත් තැනකට මාරු කොට ඔරු තල්ලට හේත්තු වී වම් අතින් යොත අල්ලා ගත්තේ ය.

(මහල්ලා සහ මුහුද - පරිවර්තනය - සිරිල් සී. පෙරේරා)

ප්‍රායෝගික අභ්‍යාස

i. **පාසලේ ඉතිරි කිරීමේ සිසු ගිණුමක් ආරම්භ කිරීමට බැංකු නිලධාරි මහතකු සමග පාසල් සිසුවකු සිදු කරන සංවාදයක් ගොඩනගන්න.**

ii. **පාසලේ පවත්වන ලද දන්ත සායන කදවුරේ දී පාසල් සිසුවකු වෛද්‍ය කාර්ය මණ්ඩල නිලධාරියකු සමග සිදු කරන සංවාදයක් ගොඩනගන්න.**

උක්ත අනුක්ත භේදය

දෙමාපියෝ දරුවන් සමග පාසලට යති.

ඉහත වාක්‍යයේ 'දෙමාපියෝ' යන්න කර්තෘ වෙයි. එය "යති" නමැති ආඛ්‍යාතය හා බැඳෙන උක්ත පදය යි. 'දරුවන්' යන පදය ක්‍රියාවට යටත් වන කර්ම පදය යි. එය අනුක්ත පදය වේ. මේ අනුව,

"වාක්‍යයක අවසාන ක්‍රියා පදයෙන් කියැවෙන පදය උක්ත පදය යි. එසේ නො වන්නේ අනුක්ත පදය යි."

උක්ත පද, අනුක්ත පද බවට හැරවෙන ආකාරයට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

සචේතන නාම පද

උක්ත පද	අනුක්ත පද
මිනිසා	මිනිසා
මිනිස්සු	මිනිසුන්
ගුරුවරයා	ගුරුවරයා
ගුරුවරු	ගුරුවරුන්
බල්ලා	බල්ලා
බල්ලෝ	බල්ලන්
කාන්තාව	කාන්තාව
කාන්තාවෝ	කාන්තාවන්
කුමාරතුංගයෝ	කුමාරතුංගයන්
ගුරුළුගෝමීහු	ගුරුළුගෝමීන්

සචේතන අනියමාර්ථ නාම පද

උක්ත පද	අනුක්ත පද
මිනිසෙක්	මිනිසකු/මිනිසෙකු
ළමයෙක්	ළමයකු/ළමයෙකු
කාන්තාවක්	කාන්තාවක
දැරියක්	දැරියක
බල්ලෙක්	බල්ලකු/බල්ලෙකු

සචේතන සර්ව නාම පදවල පුරුෂ භේදය අනුව උක්තානුක්ත පද

රූපය	උක්ත පද	අනුක්ත පද
උත්තම පුරුෂ	මම අපි	මා අප
මධ්‍යම පුරුෂ	තෝ ඔබ නුඹ/නුඹලා	තා ඔබ නුඹ/නුඹලා
ප්‍රථම පුරුෂ	ඔහු ඔවුහු හේ/හෙතෙම ඕ/ඈ/ඇය	ඔහු ඔවුන් ඔහු ඇය

අචේතන නාම පද

උක්ත පද	අනුක්ත පද
ගංගාව	ගංගාව
ගංගා	ගංගා
රීතිය	රීතිය
රීති	රීති

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

අචේතන අනියමාර්ථ නාම පද

උක්ත පද	අනුක්ත පද
ගංගාවක්	ගංගාවක්
රීතියක්	රීතියක්

සචේතන රූප ගැන්වූ නාම පද

උක්ත පද	අනුක්ත පද
ගංගාවෝ	ගංගාවන්
රීතීහු	රීතීන්
වාක්‍යයෝ	වාක්‍යයන්

ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පිරවීමට යෙදිය හැකි නිවැරදි පදය වරහන් තුළින් තෝරන්න.

    i. මම හොඳින් ඉගෙන .... (ගනිමි/ගත්තෝ ය).

    ii. (සිසුහු/සිසුන්) .... ගුරුතුමාට ආචාර කළහ.

    iii. (කාන්තාවක්/කාන්තාවක) .... රිය අනතුරකට භාජනය වූවා ය.

    iv. (දැරියක්/දැරියක) .... මල් කඩන්නී ය.

    v. ගංගාව වේගයෙන් ගලා .... (බසියි/බසිති).

    vi. ගුරුවරු .... (අපට/අපිට) අවවාද දෙති.

    vii. ඒ තෙමේ දක්ෂ ලෙස .... (නටයි/නටති).

    viii. ඔවුහු රටට සේවය .... (කළහ/කරයි).

    ix. ළමයෙක් උදෑසන පාසලට .... (එයි/එති).

    x. මිනිස්සු .... (ගවයන්/ගවයෝ) කුඹුරට දක්කති.